මෙවර ඇය ඔස්කාර් සම්මානයට පාත්‍ර වූ "හර්ට් ලොකර්" චිත්‍රපටයද සිනමා ඉතිහාසය පුරා පිරිමි අධ්‍යක්ෂ වරුන් අත රැඳී තිබූ යුධ සිනමා ශානරය යටතට ගැනෙන්නකි. 2004 වර්ෂයේ එක්තරා වසන්ත සමයක ඉරාක යුධ බිම තුළ සිදුවන සිදුවීම් මාලාවක් "හර්ට් ලොකර්" පසුබිම් කර ගනී. අතිශය කෲරතර වූ යුද්ධයත්, මනුෂ්‍යත්වයේ සංවේදී බවත් පිළිබඳ පුළුල් සංවාදයක් අරඹන මෙම චිත්‍රපටය, මිනිස් ජීවිත විනාශ කරවන යුද්ධයක යෙදෙන ඇමරිකානු සොල්දාදුවන් පිරිසක් සමග ජීවිතයක වටිනාකම සොයන තවත් බෝම්බ නිශ්ක්‍රිය අංශයක් ඉරාක යුධ පෙරමුණේ සිදු කරන මානසික අරගලය වස්තුවිෂය කොටගෙන තිබේ. "හර්ට් ලොකර්" යුධකාමී ලෝකය පිළිබඳව බිග්ලෝ ගේ සමාජ දැක්ම කියාපායි. චිත්‍ර ශිල්පය හා කලාව හැදෑරූ බිග්ලෝ ප්‍රචණ්ඩ සිනමාවට කලාව එක් කළ සිනමාකාරියක් ලෙස හැඳින්වීමට විචාරකයින් වැඩි කැමැත්තක් දක්වයි. 1951 නොවැම්බර් 27 වන දින ඇමරිකාවේ කැලිෆෝනියා ප්‍රාන්තයේ උපත ලද බිග්ලෝ කුඩා කලදීම චිත්‍ර ශිල්පයට හා කලාවට දැක්වූයේ මහත් ඇල්මකි. ඇගේ පියා තීන්ත කම්හලක කළමනාකරුවකු වූ අතර, මව පුස්තකාලයාධිපතිනියක වූවාය. ද්විතීය අධ්‍යාපනයෙන් පසුව ඇය සෙන්ට්ෆ්‍රැන්සිස්කෝ කලාගාරයට බැඳී චිත්‍ර ශිල්පය හා කලාව ප්‍රගුණ කළ අතර, ශිෂ්‍යත්වයක් හිමිකර ගනිමින් සංකල්පීය චිත්‍ර ප්‍රගුණ කිරීමට ඇය අවස්ථාව උදාකර ගත්තාය. පළමු වරට සිනමාව ඉගෙනීමට ඇය කොලොම්බියා සරසවියට ඇතුළුවන්නී 1979 වසරේදිය. සිනමා සිද්ධාන්ත හා සිනමා විචාරය පිළිබඳව හැදෑරීමට එහිදී ඇයට හැකි වූ අතර,·. සෞන්දර්යය කලා ශාස්ත්‍රපති උපාධිය ඇය හිමිකර ගත්තේද එම වසර තුළදීය.




ඇගේ සිහින් රූමත් දේහය කලක් ඇය නිරූපිකාවක් බවට පත්කර තිබුණි. ඇගේ සිනමා රංග සම්ප්‍රාප්තිය එළැඹෙන්නේ ද මේ හරහාය. . ඒ "බෝන් ඉන් ෆ්ලේම්ස්" (1983) චිත්‍රපටයේ රංගනයට ඇය දායක වීමෙනි. 1981 දී ලව්ලස් (1981) චිත්‍රපටය නිර්මාණය කිරීමත් සමගම ඇගේ සිනමා අධ්‍යක්ෂණයේ සමාරම්භයත් සිදුවිය. හොලිවුඩ් සිනමාවේ අධ්‍යක්ෂවරුන් අතර පතාක යෝදයකු වූ වෝල්ටර් හිල් ගේ අවධානයට ඇය පාත්‍ර වීමත් සමගම මහා සිනමා ප්‍රවාහයට එක් වීමට ඇයට හැකි විය. මේ අතර ඉතා සුළු කාලයක් නිව්යෝර්ක් නගරයේ මොඩන් ආර්ට් කෞතුකාගාරයේ රැකියාවක නිරත වන ඇය 1987 දී "නියර් ඩාක්" චිත්‍රපටය අධ්‍යක්ෂණය කරමින් එක්තරා ආකාරයක අධ්‍යක්ෂක වරියක් ලෙස අනන්‍යතාවයක් ගොඩනගා ගනී. ඉන් අනතුරුව ඇය බ්ලූ ස්ටීල් (1990), නිර්මාණය කළාය. බිග්ලෝගේ ජීවිතය ආර්ථික අතින් සරුසාර කළ චිත්‍රපටය වූයේ 1991 දී ඇය අධ්‍යක්ෂණය කළ "පොයින්ට් බ්‍රේක්" චිත්‍රපටයයි. එය බොක්ස් ඔෆිස් වාර්තා බිඳ හෙලමින් ඇගේ සිනමා ඉදිරි ගමන සුරක්ෂිත කළ චිත්‍රපටය බවට පත් විය.

දීර්ඝ රූපවාහිනී මාධ්‍ය ගමනකට මුල පුරමින් ද "වයිල්ඩ් පාම්ස්" නමින් A.B.C ආයතනයට ඇය නිර්මාණය කළ කෙටි රූපවාහිනී නාට්‍ය මාලාව රූපවාහිනී ක්ෂේත්‍රයේ ස්ථාවරත්වයක් ඇතිකර ගැනීමට ඇයට ඉවහල් විය. ඇගේ කලින් සැමියා වූ ජේම්ස් කැමරොන් සමග සම්බන්ධව ඇය නිර්මාණය කළ ස්ට්‍රේන්ජ් ඩේස් (1995) චිත්‍රපටයත් සමගම කැමරොන් – බිග්ලෝ නිර්මාණාත්මක සුසංයෝගය වැඩි වර්ධනය විය. , පසු කාලීනව කැමරොන් නිර්මාණය කළ ටයිටැනික් චිත්‍රපටයටද ඇගේ නිර්මාණාත්මක දායකත්වය ලැබිණි. ජෝන් ඔෆ් ආක් ඓතිහාසික කතා පුවත සිනමාවට නැගීමේ උත්සාහයක් 1972 සිට ඇය තුළ තිබූ අතර, පසුව ජර්මනියේ ප්‍රකට සිනමා අධ්‍යක්ෂ වරයකු වූ ලූක් බෙසන් සමග සම්බන්ධව එම චිත්‍රපටය නිර්මාණය කළත්, ඔහු ඇය හා බැඳී තිබුණු සබඳකම කඩකළ බැවින්, නවු මගට බැසීමට බිග්ලෝට සිදුවිය. හොලිවුඩ් සුපිරි නළුවන් දෙදෙනෙකු වූ හැරිසන් ෆෝඩ් හා ලියම් නීසන් මෙහෙයවමින් ඇය නිර්මාණය කළ ක්‍රියාදාම චිත්‍රපටයක් වූ "කේ 19" (2002) ලොව පුරා මහත් ජනප්‍රසාදයක් දිනා ගත්තේය.

ඔස්කාර් සම්මානය ඇයට හිමිකර දෙන හාර්ට් ලොකර් චිත්‍රපටය ඇය අරඹන්නේ දීර්ඝ නිහැඬියාවකින් පසුවය. එය ඇකඩමි සම්මාන උළෙලේ අවසන් අදියර දක්වා තරඟ වැදුණේ ඇගේ කලින් සැමියා වූ කැමරන් ගේ "ඇවේටර්" චිත්‍රපටය සමගයි. ඒ වන විටත් ඇවේටර් චිත්‍රපටය ගෝල්ඩන් ග්ලෝබ් සම්මාන උළෙලේදී හොඳම අධ්‍යක්ෂණය සඳහා වූ සම්මානය හිමිකරගෙන තිබූ බැවින්, ඒ සඳහා දැඩි අපේක්ෂාවක් කැමරොන් තුළ තිබුණොට සැකයක් නැත. දෛවය විසින් ඇයට ඇගේ සැමියා අභිබවා යෑමට නොපැතූ මොහොතක් උදාවිය. එය කැමරන් තුළ පරාජිත හැඟීම් ඇති කරන සිදුවීමක් වුවත්, බිග්ලෝගේ ධෛර්යය සම්පන්න සිනමා චාරිකාවේ කූටප්‍රාප්තිය හඟවන මං සලකුණක් ලෙස සැළකීම යුක්ති සහගත වේ.

**නාමල් ප්‍රසන්න ලියයි.**